# උතුරු පළාත් පාසල්වල, ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1(අ) ශ්‍රේණියේ තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2015 – (02)

උතුරු පළාත් පාසල්වල, ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1(අ) ශ්‍රේණියේ තනතුරු වල පහත දැක්වෙන පළමු **(I)** වගුවේ සඳහන් වූ පරිදි අදාළ පුරප්පාඩුවලට දෙමළ, ඉංග්‍රීසි හා සිංහල මාධ්‍ය උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු සඳහා වන විභාගය 2015 නොවැම්බර් මස උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පවත්වනු ලැබේ. දෙවන **(II)** වගුවේ දැක්වෙන පරිදි අදාළ තනතුරුවලට නියමිත සුදුසුකම් ඇති අපේක්ෂකයන්හට අයදුම් කිරීමට සුදුසුකම් ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2015/11/06 වේ.

**I වගුව - අධ්‍යාපන කලාප මට්ටම, විෂය කාණ්ඩය හා මාධ්‍යය සම්බන්ධ පුරප්පාඩු තොරතුරු**

| පුරප්පාඩු පවතින අධ්‍යාපන කලාපය / විෂය | භාෂාව | | ගණිතය | | විද්‍යාව | | භූගෝලය | | තොරතුරු තාක්ෂණය | | ඉංග්‍රීසි | | ආර්ථික විද්‍යාව | | ගිණුම්කරණය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මාධ්‍යය** | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල |
| මඩු | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | ✓ | -- |
| දූපත් | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | -- | -- |
| තුනුක්කායි | ✓ | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| මුලතිව් | ✓ | ✓ | -- | ✓ | -- | ✓ | ✓ | -- | -- | ✓ | -- | ✓ | ✓ | -- | ✓ | -- |
| කිළිනොච්චි | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | ✓ | -- |
| වවුනියාව උතුර | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | -- | -- | -- | -- | ✓ | -- | -- | -- |
| වවුනියාව දකුණ | -- | ✓ | -- | ✓ | -- | ✓ | ✓ | -- | -- | ✓ | -- | ✓ | ✓ | -- | ✓ | -- |

( "✓" යන ලකුණ පුරප්පාඩු ඇති බවද "--" යන ලකුණ පුරප්පාඩු නොමැති බවද සඳහන් වේ)

02.0 **බඳවා ගැනීමේ සේවා කොන්දේසි**

02.1 2014.10.23 දිනැති 1885/38 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

02.2 මෙම සේවය ස්ථාන මාරු සේවයකි. මෙම පත්වීම් ලබන අය උතුරු පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

02.3 යම් කිසි ස්ථානයක පත්වීම ලබන ගුරුවරයෙකු එම සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 06 ක් නොකඩවා අනිවාර්යයෙන්ම සේවය කල යුතුයි.

03.0 **වැටුප් පරිමාණය**

මෙම තනතුරට අලුතින් බඳවා ගනු ලබන ගුරුවරයෙකුට අදාළ මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (XII) ට අනුව රු. **13,410-145 x 6 -180 x 7 – 215 x 2- 15,970/=** වේ. (වැටුප් කාණ්ඩය GE -1-2006 හි 14 වන පියවර වන රු. **15,540/=** පිහිටවනු ලැබේ.)

04.0 **සාමාන්‍ය සුදුසුකම්**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

**හා**

04.2 අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතුය.

**හෝ**

අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. එනම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වර්ෂ 06ක කාලයෙන් අඩු වශයෙන් වර්ෂ 03 ක් වත් උතුරු පළාත තුළ ස්ථිරව හා නොකඩවා පදිංචිය ඇති අයෙක් විය යුතුය.

සටහන 1
දෙමළ මාධ්‍ය අපේක්ෂකයන් තේරීමේදී තරග විභාගයේ වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළට හා අදාළ පුරප්පාඩු පවතින පාසැල් පිහිටි දිස්ත්‍රික්කයේ පදිංචි අපේක්ෂකයන්ට මූලික තැන දීමෙන් පසුව ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී පළාත් මට්ටමින් වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළ සැළකිල්ලට ගනු ලැබේ.

සටහන 2
සිංහල මාධ්‍ය අපේක්ෂකයන් තේරීමේදී තරග විභාගයේ වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළට හා අදාළ පුරප්පාඩු පවතින පාසැල් පිහිටි දිස්ත්‍රික්කයේ පදිංචි අපේක්ෂකයන්ට මූලික තැන දීමෙන් පසුව ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී පළාත් මට්ටමින් වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළ සැළකිල්ලට ගනු ලැබේ. තවද පුරප්පාඩු ඉතිරිව ඇත්නම් උතුරු පළාත හැර වෙනත් පළාත් වලින් ඉල්ලුම් කළ අපේක්ෂකයන්ගේ වැඩිම ලකුණු පිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ.

04.3 වයස :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 18 නොඅඩු සහ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

04.4 යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

05.0 **අධ්‍යාපන සුදුසුකම්**

05.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් වී ඇති පරිදි අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර, අධ්‍යාපන විෂයට වගකිව යුතු මධ්‍යම රජයේ අමාත්‍යාංශ ගුරුපත්වීම් වලට අදාළ, අනුමත විශේෂ විෂයන් වලට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිළිගත් වෙනත් ආයතනයකින් නිකුත් කළ උපාධි සහතිකය ලබා තිබිය යුතුය.

ඒ සමග

**05.2** අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙමළ භාෂාව හෝ සිංහල භාෂාව හා ගණිතය යන විෂයයන් අනිවාර්යයෙන් සමත්විය යුතුයි.

**II වගුව විෂය කාණ්ඩය හා සපුරා තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්**

| **විෂය අංකය** | **විෂය කාණ්ඩය** | **සපුරා තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්** |
|---|---|---|
| ***01*** | ගණිතය | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය ප්‍රධාන විෂයක් ලෙස ලබාගත් විද්‍යාවේදි උපාධිය තිබිය යුතුයි. |
| ***02*** | විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙෂ ලබා ගත් විද්‍යාවේදි උපාධිය තිබිය යුතුයි. |
| ***03*** | දෙමළ භාෂාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂාව විශේෂ විෂයක් ලෙස හෝ ප්‍රධාන විෂයකින් එකක් ඇතිව ලබා ගත් කලා උපාධිය තිබිය යුතුයි.(විශේෂ උපාධි ඇති අපේක්ෂකයන් හට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) |
| ***04*** | තොරතුරු තාක්ෂණය | පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස ලබාගත් විද්‍යාවේදි උපාධිය/පරිඝණක විද්‍යා උපාධිය තිබිය යුතුයි. |

| | | |
|---|---|---|
| ***05*** | ඉංග්‍රීසි භාෂාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි විෂය ප්‍රධාන විෂය ලෙස ලබා ගත් කලා උපාධිය විය යුතුයි. |
| ***06*** | සිංහල භාෂාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල විෂය ප්‍රධාන විෂය ලෙස ලබා ගත් කලා උපාධිය විය යුතුයි. |
| ***07*** | භූගෝල විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විෂය විශේෂ විෂයක් ලෙස හෝ ප්‍රධාන විෂයකින් එකක් ඇතිව ලබා ගත් කලා උපාධිය තිබිය යුතුයි.(විශේෂ උපාධි ඇති අපේක්ෂකයන් හට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) |
| ***08*** | ආර්ථික විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් වාණිජවේදි / කළමනාකරණ උපාධිය<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආර්ථික විද්‍යාව විෂය විශේෂ විෂයක් ලෙස හෝ ප්‍රධාන විෂයකින් එකක් ඇතිව ලබා ගත් කලා උපාධිය තිබිය යුතුයි.(විශේෂ උපාධි ඇති අපේක්ෂකයන් හට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) |
| ***09*** | ගිණුම්කරණය | පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජවේදි උපාධිය හෝ කළමනාකරණ උපාධිය ලබා තිබිය යුතුයි. |

06.0 **බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත පරීක්ෂණයේ කුසලතාව මතද, බඳවා ගන්නා අවස්ථාවේ ක්‍රියාත්මකව ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලටද, බඳවා ගැනීමේ පරිපාටිවලටද, රජයේ හා පළාත් ප්‍රතිපත්තිවලටද, ගුරු සේවා ව්‍යවස්ථාවටද අදාලව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය මගින් මෙම දැන්වීමේ ඉල්ලා සිටි සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුරට අයත් හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණය පැවැත්වීම, ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අමතර ලකුණු ලබා දෙනු නොලැබේ. පත්වීම සඳහා තෝරා ගන්නා අවස්ථාවේදී ස්ථිර පදිංචිය සම්බන්ධයෙන් 04 වන ඡේදයට අවධානය යොමුකරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් නොකරන ලද සහතික සැලකිල්ලට ගනු නොලැබේ.

06. 1 මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර මෙහි සඳහන් කර ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු ය. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ

06. 2 පුරප්පාඩු වලින් 3% ක් ආබාධිතයන් සඳහා වෙන් කරනු ලැබේ. අයදුම්කරුවන් පත්වීම සඳහා තේරීමේදී ආදාළ තනතුරේ සේවය කිරීමට ඔහුගේ ආබාධිත තත්වය රාජකාරි කටයුතු කිරීමට බාධාවක් නොවන බවට වෛද්‍ය පරීක්ෂණයකින් සනාථ කළ යුතුය.

06. 3 මෙම පරීක්ෂණය විවෘත තරග විභාගයක් වුවත් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා අවම වශයෙන් 40% ලකුණු ප්‍රමණයක් ලබා ගත යුතුය.

06. 4 උපාධිධාරීන් තමන්ගේ සුදුසුකම් වලට අදාළ වන විෂයයන් වලට පමණක් අයදුම් කළ යුතු අතර එම විෂයයන් සියල්ල සඳහන් කර එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් එවිය යුතුය. එම විෂයයන් වලට ආදාළව පත්වීම් ලබාදෙනු ලැබේ. ගුරු සේවයට ඉල්ලුම් කරන විෂය/විෂයයන් පසු කාලයකදී කුමන හේතුවක් මත හෝ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07.0 **ලිඛිත පරීක්ෂණය**

මෙම විභාගය දෙමළ, සිංහල යන භාෂා මාධ්‍යයන් දෙකෙන්ම පැවැත්වේ. අපේක්ෂකයන් තමන් කැමති මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය හැක. මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| අංක | ප්‍රශ්න පත්‍ර | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | සාමාන්‍ය දැනීම | ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතවේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |

08.0 **විභාග ගාස්තු**

අයදුම්කරුවන් පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් රු. 500/- ක මුදලක් ගෙවා**, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමාගේ, අංක 3003** දරණ ගිණුමට බැර වන ලෙස ලබා ගන්නා ලදපත ඉල්ලම් පත්‍රයේ නියමිත තීරුවේ නොගැලවෙන ලෙස අලවා එවිය යුතුය. කිසිම හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන බවත් මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බවත් සැලකිල්ලට ගත යුතුය. විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන 3
උතුරු පළාතට පිටත සිටින වෙනත් පළාත් වල සිංහල අපේක්ෂකයන් තමන්ගේ ඉල්ලුම්පත්‍රය යොමු කිරීමේ දී **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත."** යන නමට යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මාරු කිරීමට හැකි වන පරිදි ලබා ගන්නා ලද රු 500/= ක වටිනාකමකින් යුත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රය සමග එවිය යුතුයි.

09.0 **අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම**
අපේක්ෂකයන් විභාගයට පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ඔහුගේ අනන්‍යතාවය විභාග පරීක්ෂකවරුන්ට තහවුරු කල යුතුයි. ඒ සඳහා පහත ලියකියවිලි වලින් එකක් හෝ අවශ්‍ය වේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය (pass port)

ඉහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයන්ගේ විභාගයට පෙනී සිටීමේ අයිතිය විභාග පරීක්ෂකවරුන්ගේ තීරණය පරිදි අවලංගු කළ හැක.

10.0 **අයදුම් කරන ක්‍රමය**

10.1 මෙම දැන්වීමේ අවසානයේ පෙන්නුම් කර ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ ( සෙ.මි. 21 x සෙ.මි. 29) කොළයක දෙපසම භාවිතයට ගනිමින් පළමුපස පිටුවේ 1 සිට 12.4 දක්වාද අනෙකුත් කරුණු දෙවන පිටුවට ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.11.06 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් වීදිය, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.2 මේ වන විට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන නිලධාරීන් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් තම අයදුම්පත ඉදිරිපත් කළහොත් පමණක් ඔවුන්ගේ සේවය විශ්‍රාම වැටුපට ගණනය කරනු ලැබේ.

10.3 අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

10.4 ගුරු පුරප්පාඩු කිහිපයකට අයදුම්කළ අයදුම්කරුවන් ඔවුන්ගේ කැමැත්ත අනුව තෝරාගත් පිළිවෙල නිවැරදිව සඳහන් කළ යුතු අතර එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10.5 ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පතේ ඡායා පිටපත හෝ නැවත එවනු ලබන වෙනත් පිටපත් භාර ගනු නොලැබේ.

10.6 විභාගයට ආදාළ වන ප්‍රවේශපත්‍ර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර එවීම ඔබගේ සියළු සුදුසුකම් සපුරා ඇති බවට නොසැලකේ.

10.7 අයදුම්පත් එවා ඇති සුදුසුකම් ලත් අයදුම්කරුවන් මෙම විභාගය පැවැත්වීමට දින 03 කට ප්‍රථමයෙන් ප්‍රවේශ පත්‍ර නොලැබී තිබේනම්, නොලැබී තිබීම සම්බන්ධයෙන් සියලු විස්තර සමග උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලයෙන් විමසිය යුතුය (දුරකතන අංකය 021-2219981 )

11.0 **අසත්‍ය බව තහවුරු වූ විට ලැබෙන දඬුවම්**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිල්ලෙන් නිවැරදි තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරු ඉදිරිපත් කළ යම්කිසි තොරතුරක් අසත්‍ය බව තහවුරු වුවහොත් කුමන අවස්ථාවකදී හෝ අපේක්ෂකයා පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කළ හැක.

12.0 **විභාගය මධ්‍යස්ථානය**

මෙම විභාගය යාපනය හා වව්නියාව දිස්ත්‍රික්ක දෙකේදී පමණක් පවත්වනු ලැබේ.

13.0 මෙම දැන්වීමේ සඳහන් නොකළ හෝ අපහැදිලි කරුණු සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් තීරණය කරනු ලැබේ.

14.0 විභාග අපේක්ෂකයන් විභාග කොන්දේසිවලට අනුව හැසිරිය යුතුයි.

15.0 පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරයාට බලය ඇත.

16.0 මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමෙ සම්බන්ධ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතු වේ.

17.0 දෙමළ මාධ්‍යය හෝ සිංහල මාධ්‍ය වෙනස්කම් කිසිවක් ඇත්නම් දෙමළ මාධ්‍ය නිවැරදි බව සැළකේ.

18.0 මෙම දැන්වීම උතුරු පළාත් සභාවේ www.np.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

*ආර්. වරදලිංගම්.*
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
2015.10.07